# භූගෝලවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය

## දීප ව්‍යාප්ත සිතියම් නිර්මාණ තරඟාවලිය -2021

කොළඹ විශ්වවිද්‍යාලයේ භූගෝලවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් **2021** ජුනි මස **5** වන දිනට යෙදෙන ලෝක පරිසර දිනය හා සමගාමීව දීප ව්‍යාප්ත සිතියම් නිර්මාණ තරඟාවලියක් (NLMC-**01**) සංවිධානය කර ඇත. තමා අවට පරිසරය පිළිබඳව සිසුන්ගේ නිර්මාණාත්මක පරිකල්පනය වර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව මෙම තරඟය සංවිධානය කිරීමට දෙපාර්තමේන්තුව සැලසුම් කරන අතර මෙමගින් විවිධ සිතියම්කරණ සංකල්ප පිළිබඳ නව පරපුරේ අවබෝධය වැඩි දියුණු කර, මනා සිතියම් විද්‍යානුකූල ක්‍රම භාවිත කරමින් සිතියම් නිර්මාණයට ඇති උනන්දුව වැඩි දියුණු කිරීම ද මෙමඟින් අරමුණු කරයි.

## NLMC-01 තේමාවː මගේ මාතෘ භූමිය

### ත්‍යාග සහ සහතිකපත්ː

සෑම මට්ටමක ම පළමු, දෙවන හා තෙවන ස්ථාන දිනා ගන්නා ජයග්‍රාහකයින්ට, සහතික පත්‍ර සහ මුදල් ත්‍යාග පිරිනැමේ. සියලු ම ඉදිරිපත් කිරීම් කොළඹ විශ්වවිද්‍යාලයේ භූගෝලවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නම් කරනු ලබන විශේෂ විද්වත් මණ්ඩලයක් මඟින් සමාලෝචනය කර ඇගයීම සිදු කරනු ලැබේ.

### වැදගත් දිනයන්ː

සිතියම් ඉදිරිපත් කිරීම් ආරම්භයː 2021 ජුනි 05

සිතියම් ඉදිරිපත් කිරීම් අවසානයː 2021 සැප්තැම්බර් 05

ජයග්‍රාහකයින් නිවේදනයː 2021 ඔක්තෝබර් 05

### ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ː

1. පහත මට්ටම් යටතේ ඉදිරිපත් කිරීමේ සිදු කළ හැකි ය.

   පාසල් මට්ටමː අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ අ.පො.ස. උසස් පෙළ සිසුන් සඳහා

   විශ්වවිද්‍යාල මට්ටම: පළමු, දෙවන, තෙවන සහ සිව්වන වසර සිසුන් සඳහා

2. සියලු ම ඉදිරිපත් කිරීම් නිසි පරිදි සම්පූර්ණ කරන ලද සිතියම් ඉදිරිපත් කිරීමේ පෝරමය සමඟ පහත විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.
   **mapcontest@geo.cmb.ac.lk**

3. සිතියම සෑදීමේ දී සුදුසු ඕනෑ ම වර්ණ / වර්ණ සංයෝජනයක් භාවිත කළ හැකි ය.

4. සියලු ම අතින් අඳින ලද සිතියම්වල ප්‍රමාණය (පළල සහ උස) අඟල් 11.69 × 16.54 විය යුතු ය ( A3 ප්‍රමාණය).

5. පරිලෝකනය කරන ලද (scanned) හෝ ඡායාරූප ගත කළ (photographed) සිතියම්, ඉදිරිපත් කිරීමට පෙර JPEG ආකෘතිවලට සකස් කළ යුතු ය. උදාː සියලු ම පාසල් හා විශ්වවිද්‍යාල මට්ටමේ ඉදිරිපත් කිරීම් මෘදු පිටපත් ලෙස ඉදිරිපත් කළ යුතු ය. JPEG ආකෘතිවලට සකස් කළ අතින් අඳින ලද සිතියම් හෝ පරිගණක ආධාරක සිතියම්වල විභේදනය (resolution) 500 -800dpi අතර විය යුතු ය.

6. සියලු ම පාසල් මට්ටමේ ඉදිරිපත් කිරීම් අතින් අඳින ලද සිතියම් විය යුතු ය (පරිගණක ආධාරක සිතියම් සඳහා අවසර නොලැබේ.)

7. විශ්වවිද්‍යාල මට්ටමේ ඉදිරිපත් කිරීම් අතින් අඳින ලද සිතියම් හෝ පරිගණක ආධාරක සිතියම් විය හැකි ය. පරිගණක ආධාරක සිතියම් නිර්මාණය සඳහා ඕනෑ ම මෘදුකාංගයක් භාවිත කළ හැකි ය.

8. සියලු ම සිතියම්, නිර්මාණාත්මක, සත්‍ය කතෘ විසින් නිර්මාණය කරන ලද හා වෙනත් තරගවලට ඉදිරිපත් නොකළ හෝ ප්‍රකාශයට පත් නොකළ ඒවා විය යුතු ය.

9. එක් සිසුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් සිතියමක් පමණි.

10. ඉදිරිපත් කිරීමේ පටිපාටියන්ට අනුකූල නොවන ඉදිරිපත් කිරීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**තොරතුරු සඳහා සම්බන්ධ වන්න.**

ආචාර්ය. ආනන්ද කරුණාරත්න
සම්බන්ධීකාරක
දීප ව්‍යාප්ත සිතියම් නිර්මාණ තරගාවලිය: NLMC-**01**
භූගෝලවිද්‍යා දෙපාර්තමේන්තුව
කොළඹ විශ්වවිද්‍යාලය
කාර්යාලයීය දුරකථන අංකය: 0112-500458
ජංගම දුරකථන අංකය: 0714-905614
විද්‍යුත් තැපැල: **mapcontest@geo.cmb.ac.lk**